# අරුම පුදුම බැලුම



තසලී හඳපාන්ගොඩ

# අරුම පුදුම බැලුම

තසලි හඳපාන්ගොඩ

# අරුම පුදුම බැලුම

## එච්.එම්. තසලි හඳපාන්ගොඩ

කතෘ

කතෘගේ වෙනත් කෘති

**පින්කි**

කු/ ශාන්ත බර්නදෙත් ආදර්ශ මහා විද්‍යාලය,

(ජාතික පාසල) - පොල්ගහවෙල.

4 ශ්‍රේණිය E

ප්‍රකාශිත දිනය - 2026.05.10

ISBN – 978-624-211-248-0

# පිදුම

මට සිප් සතර ලබා දී
දැනුම, කුසලතා සහ
ආකල්ප වලින්
මා පෝෂණය කරන
ආදර ශාන්ත බර්නදෙත්
විදු මෑණියන්ට
මේ පොත
මම ආදරයෙන් පුද දෙමි...



# ස්තූතිය...

මේ පොත ලියන්න මා දිරිමත් කළ

මගේ ආදර අම්මාට...

පොත ලියන්න අවශ්‍ය දෑ සපයා දුන්

මගේ ආදර අප්පච්චිට...

පොත ලියද්දී කරදර නොකල

මගේ ආදර මල්ලිලා දෙදෙනාට...

පොත අගේ කල

මගේ ආදර නෑදෑයින් සැමට...

පොත ලස්සනට සකසා දුන්

මගේ ආදර යාලු නැන්දීට...

පොත ලියන්න පණිවිඩ එවූ

මගේ ආදර සිඟිති අම්මාට

ආදර මින්සි අක්කීට

ආදර තනුජා නැන්දාට සහ

ආදර පොත් සර්ට

පොත් ලියන්න දිරි දී අපව ගත්කතුවරුන් කළ

ආදර මහමයා විදු මෑණියන්ට

මගේ ආදර ස්තූතිය....!

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමයා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන ''හේමමාලා උපහාර'' ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය.

දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය, කන්ද උඩරටට අගයක් එකතු කළ, ශ්‍රී දළදා වහන්සේ වැඩමකරා වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

**ශශිකලා සේනාධීර,**

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සරත් බී.එස්. අභයකෝන්,**

ආණ්ඩුකාරවරයා - මධ්‍යම පළාත

සම්මානිත මහාචාර්ය,

පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහපතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයට ශිෂ්‍ය දියණිවරුන්ලා සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියළු දෙනාගේ විශිෂ්ඨ වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදි බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටි. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාවල විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

පුංචි ගමක මිතුල් කියලා පිරිමි ළමයෙක් හිටියා. විවිධ රටවල් ගැන විස්තර තියෙන පොතක් කියවපු එයාට, ඒ රටවල් බලන්න යන්න ආස හිතුණා. ඒත් මිතුල් දුක් වුණා. එයාට ඒ තරම් සල්ලි තිබුණෙ නෑ.



ලෝකෙ රටවල් බලන්න යන්න නැති නිසා දුකින් හිටපු මිතුල් ළඟට කරුණාවන්ත අත්තම්මෙක් ආවා. එයා ඇහුවා ''ඇයි ? මිතුල් පුතා දුකින් ඉන්නෙ'' කියලා.



මිතුල් එයාගෙ ආසාව ගැන ඒ අත්තම්මාට කීවා.

කතාව අහගෙන හිටපු අත්තම්මා පුංචි මිතුල්ට

රතුපාට බැලුම් බෝලයක් දුන්නා.



“ පුතා, මේ බැලුම් බෝලය ඔයාගෙ ආසාව ඉටුකර දේවි. සමඟියෙන් මේ බැලුම පුම්බන්න” අත්තම්මා කීවා. ඉන් පස්සෙ ඇය නොපෙනී ගියා.

මිතුල් මේ පුංචි බැලුම දිහා බැලුවා. “මේ බැලුමට මාව ලෝකෙ වටේ එක්ක යන්න පුළුවන්ද?” පුංචි මිතුල් පුදුම වුණා. මිතුල් මේ බැලුම පිම්බුවා. ගොඩාක් වෙලා පිම්බුවා. ඒත් බැලුම හරිම පෙඩ්ඩයි පිම්බුණේ. ඉතිං මිතුල් ගෙදර ගියා. පහුවදා උදේ පාසල් යනකොට මිතුල් බැලුම් බෝලය යාළුවන්ට පෙන්නන්න අරන් ගියා. මිතුල් යාළුවන්ටත් බැලුම පුම්බන්න දුන්නා. යාළුවොත් හරිම ආසාවෙන් සමඟියෙන් බැලුම පිම්බුවා. ඔන්න බැලුම තව ටිකක් ලොකු වුණා.



මිතුල්ගෙ නෑදෑයෝ, අසල්වැසියෝ හැමෝමත් බැලුම පුම්බන්න උදව් කලා. හැමෝගෙම සහයෝගයෙන් උඩ යන තරමටම බැලුම පිම්බුණා.



මේ අතරෙ මිතුල්ගෙ ආත්තම්මියි, අම්මයි පන් වලින් ලස්සන, ලොකු කූඩයක් වියලා තිබුණා, මිතුල්ට බැලුමෙ නැගලා යන්න. අප්පච්චි, සීයා සහ මාමලා එකතු වෙලා ලොකු කඹ වලින් පන් කූඩය බැලුමට තියලා හොඳට ගැටගැහුවා. ඔන්න දැන් මිතුල් ලෝකෙ වටේ යන්නයි සූදානම.

අම්මටත්, අප්පච්චිටත් අනෙක් වැඩිහිටියන්ටත් වැඳ ආශිර්වාද ලබාගත් මිතුල් පන් කූඩෙට නැග්ගා. හරිම සතුටින් පන් කූඩෙට නැග්ගත් කූඩය ඇතුලෙ මිතුල්ට ලොකු පාළුවක්, තනිකමක් දැනුණා. “බැලුම පුම්බන්න උදව් කළ හැමෝමත් මට ලෝකෙ වටේ එක්ක යන්න ඇත්නම්” කියලා පුංචි මිතුල්ට හිතුණා.



එහෙම හිතනකොටම මේ බැලුම මිතුල්ට දුන්නු කරුණාවන්ත අත්තම්මා සුරංගනාවියක් වගේ මිතුල් ඉන්න තැනට පියඹාගෙන ආවා. එයා මිතුල්ට මෙහෙම කීවා.

“මිතුල් පුතා, ඔයා ගොඩාක් හොඳ දරුවෙක්. තමන්ට උදව් කරපු අයව අමතක නොකරන උතුම් ගුණය ඔයා ළඟ තියෙනවා. ඉතින් ඔයාගෙ යාළුවෝ, නෑදෑයෝ, අසල්වැසියෝ හැමෝම එක්ක ඔයාට ලෝකෙ බලන්න යන්න පුළුවන්. ඔයාගෙ ඒ යහපත් පැතුම ඉටුවේවා” එහෙම කියලා ඒ ආත්තම්මා ඇගේ අතේ තිබුණ තරු යෂ්ඨිය සෙලවුවා.

එතකොටම අරුම පුදුම බැලුම එක්කම පන් කූඩය විශාල වුණා. මිතුල්ට හරිම සතුටුයි. එයා යාළුවෝ, නෑදෑයෝ හැමෝටම එයා එක්ක යන්න එන්න කියලා කතා කලා. හැමෝම හරිම සතුටින් බැලූනයට නැග්ගා. සුරංගනා අත්තම්මගේ මැජික් බලයෙන් බැලුම උඩටම පාවෙලා ලෝකෙ වටේ යන ගමන ඇරඹුවා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල, නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වලක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරන ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්.
ව්‍යාපෘති නිර්මාතෘ

**ISBN – 978-624-211-248-0**